**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - 2022**

**---------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා වසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය සහ 2019 ජූලි 29 දිනැති අංක 04/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපිය | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව 2022 දෙසැම්බර් 31 දිනට රු.2,084,930 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | සේවක සංවර්ධන අරමුදල හා සේවක ආරක්‍ෂක තැන්පතු, ස්ථාවර තැන්පතු ගිණුමක පවත්වා ගෙන යාම අතිරික්ත මුදල් ආයෝජනය කිරීමක් නොවේ. මීට අමතරව 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය සංස්ථා සහ ආයතන සඳහා වන යහපාලන මාර්ගෝපදේශනයට අනුව අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේ බලතල එම ආයතනවල ආයෝජන කමිටුවට පවරා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතන සංග්‍රහයේ 5 වන පරිච්ඡේදයෙහි 07 වන වගන්තිය හා 2018 දෙසැම්බර් 17 දිනැති අංක 2/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | විශ්වවිද්‍යාල 21 ක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 514 දෙනෙකුගෙන් බැඳුම්කර කඩකිරීම මත 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1,317 ක් අය විය යුතුව පැවතුණි. | අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි මඟින් උසස් අධ්‍යාපන ආයතනවල බැඳුම්කර මුදල් අයකර ගැනීමට සමාලෝචන කමිටු පිහිටුවීමට, ඒවාට මාර්ගෝපදේශයන් හඳුන්වා දීම් හා බැඳුම්කර ශේෂයන් සහ ඇපකරුවන්ගේ විස්තර වෙබ් අඩවියේ පලකිරීමට උපදෙස් දී ඇත. 2022.12.31 දිනට බැඳුම්කර කඩ කිරීම් 533 ක් හා වර්ෂය තුලදී අයකරගත් බැඳුම්කර කඩ කිරීම් 84 ක් වූ බව. | අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි ප්‍රකාරව කටයුතුකර හිඟ මුදල් අය කර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 282,613,533 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.47,293,185 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.329,906,718 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රාග්ධන ප්‍රදාන අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාව විසින් 2017 වර්ෂයේ දී මාසික කුලිය රු.350,000 කට ලබා ගෙන තිබුණු වර්ග අඩි 3,337 ක ගොඩනැගිල්ලේ ඉඩ ප්‍රමාණවත් නොවීම සහ ප්‍රවාහන අපහසුතා පැවතීම මත එම කල්බදු ගිවිසුම අවලංගුකර වර්ග අඩි 7,000 ක ගොඩනැගිල්ලක් රු.950,000 ක මාසික කුලියට ලබා ගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබාගෙන තිබු නමුත් එම අනුමැතියට පටහැනිව මාසික කුලිය රු.350,000 ක් වූ කුලී ගිවිසුම අවලංගු නොකර නව ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදීත් රු.4,200,000 ක් අමතර ගොඩනැගිලි කුලී වශයෙන් ගෙවීම් කර තිබුණි. | කුලී පදනම මත ලබාගත් වර්ග අඩි 3337 කින් යුත් ගොඩනැගිල්ලට අදාළ කුලී ගිවිසුම අහෝසි කර එහි පිහිටි අංශ කුලී පදනම මත ලබා ගත් නව ගොඩනැගිල්ලට ගෙන ඒමට නොහැකි වූ හේතු 2023.01.26 දින පැවති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 1094 වන රැස්වීමට වාර්තා කළ අතර හේතු පැහැදිලි කරමින් රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුව වෙත ලිපියක් ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති අතර ලිපිය 2023.03.14 දින රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද බව. | රජයට වඩාත් වාසිදායක වන ආර්ථිකමය තීරණ ගත යුතුය. |
| (ආ) | 2017 වර්ෂයේ පරිගණක 07ක් මිලදී ගැනීමට ගෙන තිබූ තීරණය අවලංගුකර ඒ වෙනුවට පරිගණක 04 ක් කුලියට ගැනීම හේතුවෙන් ආයතනයට පාඩුවක් සිදුවී තිබිම පිළිබඳව අමාත්‍යාංශය මගින් සිදුකර තිබූ පරීක්ෂණය මත පදනම්ව, මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණයක් කිරීම සුදුසු බව 2022 පෙබරවාරි 03 දිනැති අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දැනුම් දී | අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශයට අනුව මුදල් රෙගුලාසි 104 යටතේ කරන ලද මූලික පරීක්‍ෂණයට අනුව මෙම පරිගණක 07 මිල දී නොගෙන පරිගණක 04 ක් එම අවස්ථාවේ පැවති අවශ්‍යතාවය අනුව කුලියට ගැනීම පිළිබඳව 373 වැනි කළමනාකරණ කමිටුවේ දී හා 1086 වන කොමිෂන් සභා වාරයේ දී දීර්ඝ ලෙස අධ්‍යනය කරන ලදී. ඒ මත එළඹුණු තීරණ මේවන විට අමාත්‍යාංශය වෙත දැන්වීමට කටයුතු කර ඇති බව. | අමාත්‍යාංශ පරීක්ෂණයේ තීරණ අනුව මු.රෙ.104 ප්‍රකාරව කටයුතු කල යුතුය. |

තිබුණද මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණයක් සිදුකර අදාල ක්‍රියමාර්ග මේ දක්වා ගෙන නොතිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල වලට සිසුන් ඇතුළත් කිරීම අවසන් කිරීමෙන් පසු පවතින 3,008 ක පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම හේතුවෙන් සිසුන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමිවීම අවම කිරීම සඳහා නව ක්‍රමවේදයක් කොමිෂන් සභාව සකස්කර නොතිබුණි. | මේ වනවිට 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා පුරප්පාඩු වට 4ක් පමණ පුරවා අවසන්කර ඇති බව. | පුරප්පාඩු ප්‍රමාණය අවම කර උපරිම වශයෙන් ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශ අවස්ථා සැලසීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබූ විශ්වවිද්‍යාල ප්‍රවේශ ප්‍රතිපත්තියට බාහිරව රාජ්‍ය විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල පාඨමාලා 38 කට සිසුන් ඇතුළත් කර ගැනීමට නැවත යෝග්‍යතා පරීක්ෂණ පවත්වා තිබුණි. 2021 දෙසැම්බර් 08 දිනැති පොදු ව්‍යාපාර කාරක සභා තීරණයකට අනුව යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම සාධාරණ නොවන බව තීරණය කර තිබුණද පාඨමාලා 38 න් 18 ක් තවදුරටත් යෝග්‍යතා පරීක්ෂණ ප්‍රතිඵල මත සිසුන් ඇතුළත් කර ගැනීමට 2021/2022 අධ්‍යයන වර්ෂයේදී ද සැලැසුම් කර තිබුණි. | අධ්‍යයන පාඨමාලා 39 ක් සඳහා Z-අගය සපුරා තිබීමට අමතරව ප්‍රායෝගික/ යෝග්‍යතා පරීක්ෂණ සමත් වී තිබීම අනිවාර්යය වේ. පාඨමාලා 21ක් සඳහා ප්‍රායෝගික/ යෝග්‍යතා පරීක්ෂණ සමත් වීමේ අවශ්‍යතාවය නොමැති වුවද පාඨමාලා සඳහා ප්‍රවේශය ලබා ගැනීමට සපුරාලිය යුතු අවම සුදුසුකම් වල වෙනසක් සහිතව 2023/2024 අධ්‍යයන වර්ෂයේ සිට සිසුන් තෝරා ගැනෙනු ඇති බව. | මේ සම්බන්ධයෙන් සිසුන්ට සාධාරණයක් ඉටුවන පරිදි අවසන් තීරණයට එළඹීම කඩිනම් කළ යුතුය. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ත්‍රී පුරුෂ සහ සමාජභාවයේ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ ව්‍යාපෘතියේ වියදම් වෙනුවෙන් 2017 හා 2018 වර්ෂවල ලැබී තිබුණු රු.9,127,804 ක් වර්ෂ 03 කට වැඩි කාලයක් සිට ඌන උපයෝජිතව පැවතුණි. | මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත දැනුම් දී ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලබන බව. | අරමුදල් ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2014, 2015 හා 2017 වර්ෂවල සෞඛ්‍යය නිලධාරීන් පුහුණු කිරීම සඳහා සෞඛ්‍යය අමාත්‍යාංශයෙන් රු.12,681,589 ක් ලබා දී තිබූ අතර අදාල කාර්යය නිම කිරීමෙන් පසු ඉතිරි වූ රු.4,918,087 ක් වසර 2 ක් පමණ කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව කොමිෂන් සභාවේ රඳවාගෙන තිබුණි. | ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන් පුහුණු කිරීම සඳහා අමාත්‍යාංශයෙන් ලද මුදලින් සියලු වියදම් පියවා ගත් පසු, ඉතිරිය වැඩසටහන කළමනාකරණය කිරීමට අදාළ ගෙවීම ලෙස සලකා, එම මුදල කොමිෂන් සභාවේ වියදම් දැරීම සඳහා යොදා ගැනීමට තීරණය කර ඇති බව. | ඉතිරි ප්‍රතිපාදන නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 හා 2019 වර්ෂවලදී මෘදුකාංග සංවර්ධනය වෙනුවෙන් රු.1,413,500 ක් වැයකර තිබුණද අදාල කාර්යය නිමකිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | මෙම කාර්යයන් අවසන් වීමෙන් වූ පසු කෙරීගෙන යන වැඩ ගිණුමේ දක්වා ඇති වටිනාකම ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරනු ලබන බව. | අදාල කාර්යය කඩිනමින් නිමකර ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2017 වර්ෂයේ සිට පැවත එන නිරවුල් නොකල කොන්ත්‍රාත් රඳවා ගැනීම්වල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,291,916 ක ශේෂයක් පැවතුණි. | රු.171,247ක රඳවා තබා ගැනීම්වලින් රු.46,731ක් නිදහස් කිරීමට ඉංජිනේරු නිර්දේශය වෙත යොමු කර ඇත. ඉතිරිය සම්බන්ධයෙන් අදාළ කටයුතු ඉදිරියේදී සිදු කරනු ලබන බව. | කාලය ඉකුත් වූ රඳවා ගැනීමේ මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනධ්‍යන කාර්ය මණ්ඩලය වෙනුවෙන් වූ බඳවා ගැනීමේ පටිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය වාර්තාවේ දින දක්වාම ලබාගෙන නොතිබුණි. | අනධ්‍යයන කාර්ය මණ්ඩලය යටතේ අනුමත තනතුරු සඳහා බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි පිළියෙල කිරීමේ දී මතුව ඇති ගැටළු සාකච්ඡා කිරීමට අවස්ථාවක් ඉල්ලා 2023 මාර්තු 23 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමුකර ඇති බව. | බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර ගෙන කාර්යමණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුය. |